සොයුරියකගේ හඳින්

ග්‍රීෂ්ම සෘතුවේ අපේ ප්‍රධාන සාමාජික අංශයක් බවට පත්වෙලා තියෙන 'වැඩි සාදැසකට' කාලෙකින 'සහභාගි වුණා. වැඩි සාදැස කිව්වම ඊකත් හුනුරට දැණුනට 'බාර්බකියු ' කිව්වම නම් ඇණිකිසව අපි දන්නවා. ජයේ නම් කියන්නගම වැඩි සාදැස කියලයි. බැලුවම ඒකෙ ඇති වැරැද්දැකත් නැහැ. මොන තරම් ආරෝප කුම වලට කෙරුවත් සිදුවන්නෙ පිළිස්සීම තියා. මේ නවීන බාර්බකියු එක සතය වශයෙන් කරන්නේ අපි ශිෂයන්වය කියා හඳුන්වා ඇති දෙයින් යටපත් කර ඇති මනුසස්වයාගේ එක් ජන්ම පුරුද්දක්. ඔය වගේ ගති පුරුදු තව ඕනෑ තරම් තියෙනවා.

අපි අවට අපිට නොපේරී අපි විසින්ම නැවතත් වැලඳ ගත්ත. ගෙවල් ඇතුළේ පොකුණු හදන්නත් කැළෙ වවන්නත් ඒ පුරුද්දම තමයි. කොහොම වුණත් දැන් අපිට ඒවයින් වෙන්වෙලා වෙනම ජීවත් වෙන්න අමාරුයි. අපිත් දැන් මෙති ප්‍රධාන ජීවන ප්‍රවාහයෙකි කොටස් වෙලා ඉන්න නියා. කලකින් පැවති බාර්බකියු එකක් නියා පැමිණි සියළු දොංගේම නිසුණෝ දැඩි උද්යෝගයක්.

කොහොමත් මෙම සාදැලු උනන්දුව අත්තේ මස් පිළිස්සෙන කම් විතරනේ. ඊට පස්සෙ අනුභවය හා ආපසු යාමට ඇති හදිසිය තමයි මුල් තැන ගන්නේ. ඒත් මේ සාදැස නම් ඊට වඩා ටිකක් වෙනස් වුණා. සාදැසට පසු සියළු දෙනාම එකතු වී සහනවක් පැවැත්වුණා. ඒක හරම විනෝද දජනක එකක්. කලකින් මමුවු බොහෝ දෙනාට පැවසීමට, පිටතිරීමට අදහස් තිබුණා. සුපුරුදු පරිදි රසකථා, විතිළු, ඔඩ , හරහා සාදැස ඇදී ගියා. ඊළඟට වැස්ස, ක්‍රිකට්, යුද්ධය, දේශපාලන ආදී සුපුරුදු මාතෘකා ඔස්සේ ඇදී ගියා. කථාව නැවතුණේ කලාව තුළයි. ඒත් මේ කලාව තුළ හිරවීමට අපේ කථාවට සිදුවුයේ එක්තරා කලාකරුවෙක් නිසයි. ඔහු, ඔබ අප කවුරුත් දන්නා කරුණාරත්න දිවුල්ගනේයි.

දිවුල් හා ඔහුගේ නවතම ආණ්ඩුකාර පදවිය බොහෝ විවාද සම්පන්න මාතෘකාවක් බවට පත්වුණා. එතැන අත්තටම සිටියේ දිවුල්ගනේට බොහෝ සෙයින් පිළිකරන ඔහුගේ රසිකයින්. ඒ සියළු දොංගේම අදහස වුණේ මෙය වැරදි තීරණයක් බවයි. රජය ඔහුට කැරලි අලයක් දී ඇති බවයි. එහෙත් මා ඇතුළු දෙතුන් දෙනෙකුගේ අදහස ඊට වෙනස් එකක් වුණා. අපි කතා කළේ ඊට ප්‍රතිවිරුද්ධවයි. ඒත් බොහෝ දෙනා එය අනුමත කළේ නැහැ. ඊට බොහෝ උදාහරණත් ඔවුන් සතුව තිබුණා. මිනිසුන් බොහෝවිට තර්ක කරන්නේ මතුපිටින් පෙනෙන දේ ඔස්සේ පමණයි.

හැමෝම සතත් ගැන කථා කළා, රවීඳු ගැන කථා කළා, විශේෂයෙන් කපුගේ ගැන කථා කළා. හැමෝගෙම පොදු අදහස වුණේ ඔවුන් විසින්ම තමන්ටම වළ කපාගත් බවයි. සතත්ලා ගැන කෙසේ වෙතත් කපුගේ ගැන සමාජය බොහෝ කථා කළා ඔබටත් මතක ඇති. ඔහුට කෙතරම් නම් ගරුතුම් ලැබුණාද? ඒත් කිසිම කෙනෙක් ඔහු ඒ දේ කළේ ඇයි කියා විමසුවාද? මා මෙතෙනදී කපුගේ ගැන කියන්නේ ඔහුත් දිවුල්ගනේත් එකම මාවතක ගමන් කළ දෙදෙනෙක් නිසයි. අද සිදුවන්නේත් ඒ දේ ම නො-වේද? මට නම් හිතෙන්නේ මේ සේරම සමාජය විසින් සාදාගන්නා මනාන්තර බවයි.

කිසියම් කලාකරුවෙක් හෝ කාරයක් යම් ප්‍රගතිශීලී කාර්යයන් තුළ නිරතවීම නියා ජනතාව තුළ ඇති වන ප්‍රසාදය හරහා අප විසින්ම ඔවුන්ගේ ප්‍රතිරූපයක් අප තුළ මවා ගන්නවා. ඒ මැවෙන ප්‍රතිරූපය නිසාම කලාකරුවා ඒ තුළ සිර-වෙනවා. ඉන් මිදෙන්නට සමාජය ඔහුට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසාම ඔහුට සිදුවන්නේ තමන්ගේ ජීවිතයක් නොව; සමාජයට අවශ්‍ය ලෙස ජීවත්වෙන්නයි. ඔහු ඉන් පිට පනින අසීළුස්ලේම අර ප්‍රතිරූපය දෙදරනවා. සමාජය තුළ ඔහු අපවාදයට ලක්වෙනවා. මේක මොන තරම් දේශපාලනය කරන්න බැහැ. මේ ප්‍රතිරූප තුළ ජීවත් වෙන්නෙ අප ඔබ වගේම මිනිස් පරාණ ඔව අපිට වටහාගන්න බැරි ඇයි? ඒ නිසාම දිවුල්ගනේට ආණ්ඩුකාර පදවිය දරලා රජරට ජනතාවට යමක් කරන්න හැකිවේ'යැයි අපට හිතන්න බැරි ඇයි? ඕනෑම කෙනෙකුට උදනරණ දක්වා තර්ක කළ හැකි බව අත්ත. ඒත් සත්‍යය නම් තර්කය නොවන බවත් අපි දන්නවා නේද? සුවඳැති නෙළුම් පිපෙන්නේ පොකුණු, විල්, ජලාශවල පමණක් නොව, ඔඩ ගොහොරු වලත් පිපෙන බව අප අමතක කරන්නේ ඇයි?

හැමෝම සතත් ගැන කථා කළා, රවීඳු ගැන කථා කළා, විශේෂයෙන් කපුගේ ගැන කථා කළා. හැමෝගෙම පොදු අදහස



සාධාරණද? සදාචාරසම්පන්නද?

ඒ නිසාම කපුගේට සන්ෑලවර්ලත් එක්ක සින්දු කියන්න බැහැ, විමළි විරාවශට කොණ්ඩෝ පිරන්න බැහැ, දිවුල්ගනේට අපි කොපමණ කථා කළත්, තර්ක කළත් අපේ මතය සභාවේ පිළිගැනීමට ලක් වුණේ නැහැ. හැමෝම කිව්වේ දිවුල්ට සිදුවෙන දේ පිළිබඳවද ඇත්තේ කාලයේ ප්‍රශ්ණයක් පමණක් බවයි. සමහර විට එය හැකියි. ඒත් අප සිතිය යුත්තේ සර්ව ඇශුභවාදී ලෙසද?

හොඳ අතීතයක් තුළ නිවැරදි මාවතක ගමන් කළ මිනිසකුගේ අනාගත ක්‍රියාකාරකම් පිළිබඳව අපට විශ්වාසයක් තැබිය නොහැකි ඇයි? අපි දැන් පුරුදු පුහුණු වෙමින් සිටින්න් ඇසනට පෙනෙන, කණට ඇහෙන දේ ගැන විතරක් හිතන්නනේ, හැම දේම ඒ මොහොතට පමණයි. මේක මෙහෙම නම් ඒකත් එහෙමම තමයි. කමක් නැහැ,

මොනවා උනත් සෑහෙන අඳහස් හුවමාරුවක් සිදු වුණා. කථාව අතර අතුරු කතන්දර රාශියක් තිබුණ නිසා උණුසුම් වුණා මිස, ඇඳිමැරුණා ගතියක් දැණුනෙම නැහැ. සාදැසක වුණත් අපි ගැන, මිනිස්සු ගැන දැනගන්න තියෙනවා නම් කොපමණ වටිනවාද?

නවත් වසරක් මේ මාසෙන් අවසානයි. ළඟන වසරට සුභ පැතුම් සමග ඔබ සැමට ප්‍රීතිමත් නත්තලක් උදවේවා!'යි පතනවා.

'සොයුරියකගේ හඳින්' ලිපියට පිළිතුරක්...

පසුගිය සන්නස පුවත්පතේ 'සොයුරියකගෙ හඳින්' ලිපිය කියෙව්වම ඒ ගැන යමක් ලියන්න මටත් හිතුණා. අපි ළංකාවෙ ඉන්න කාලෙදි නම් ඔය වගේ දේවල් ඔඟිස් වලදි විතරක් නෙවෙයි වටපිටාවෙනුත් ඕන තරම් අහන්න ලැබුණා. ටෙලිෆෝන් ගිනි නියා පවුල් සඩාකප්ලස් කරගත්තු අය වගේම පවුල් රැකගත්තු අයත් හිටියා.

ක්වීන්ස්ලන්තයේ, මෙල්බර්න් වල තරම් විශාල ශ්‍රී ලාංකික පිරිසක් නැති වුණත්; සැලකිය යුතු ප්‍රමාණයක ශ්‍රී ලාංකිකයින් පිරිසක් මෙහේ ජීවත් වෙනවා. නමුත් මා දන්නා තරමට ටෙලිෆෝන් ගිනි ගැන නම් අසන්නට ලැබෙන්නේ නැති තරම් වුවත්; වෙනත් විවිධාකාර ගිනි වල- මෙහේත් නැතුව නෙවෙයි.

මම හිතන්නෙ නම් මේ හැම ගින්නකටම හේතු වෙන්නෙ ඊර්ෂ්‍යාව කියලයි. සාමාන්‍යයෙන්ම අපේ සමහර සිංහල මිනිසුන්ට තව කෙනෙක් සතුටින්, යහපත්ව, කාටවත් කරදරයක් නොවී, කාටවත් අත නොපා, තමන්ගේ පවුල ආරක්ෂා කරගෙන සිටීම තරම් උනුළන්නට බැරි තවත් දෙයක් නෑ.

අපේ මිනිසුන් අතර මතයක් තියෙනවා, දරා ගැනීමේ ශක්තිය අතින් කාන්තාව, පිරිමින්ට වඩා බොහෝ ඉදිරියෙන් ඉන්නවා කියලා. නමුත් මේ වගේ ගිනි වලදි ඒ දරා ගැනීමේ ශක්තිය බිංදුවටත් වඩා අඩු වෙනවා. බඩගිනි, ලූසෝ ගිනි සම සිතින් දරා ගන්නා ගැහැණියක්; සැකයේ ගින්න ඉදිරියේ වියරු වැටෙනවා. ඉන්පසු නිවැරදි දේ කොයිතරම් පැහැදිලිව පෙනුණත්, එය නිවැරදි බව පිළිගන්නට ඔවුන් බැඳිවෙනවා. හේතුව, අවුරුදු ගණනක් ආදරය කළ, අවුරුදු ගණනක් එකට දුක-සැප බෙද ගත් ස්වාමිකාව තමන්ට වඩා හොඳින් පිට මිනිසුන් තේරුම් ගැනීම නෙවෙයි, ගිනි අවුළුවන්නාගේ දක්ෂකමයි. නමුත්; මේ වගේ ප්‍රශ්ණ වලදි පිරිමින් කාන්තාවන් තරම් කලබල වෙන්නේ නෑ. සොයුරියකගේ හඳින් ලිපියේ සඳහන්ව තිබුණෙ කාන්තාවකට දුන් ගින්නක් ගැන වුණත්; මෙල්බර්න් වල ඉන්න ස්වාමිවරුන්ටත් තමන්ගේ බිරන්දෑවරුන් ගැන ඕනෑ තරම් නාම්කව හෝ විරිනාමිකව විවිධාකාර හොරතුරු ලැබෙනවා ඇති. මවුන් ඒ ගැන හිඟඩව සොයා බලනවත් ඇති. හුඟක් වෙලාවට ගැහැණියකගේ ජීවිතයට ගිනි අවුළුවන්නේ තවත් ගැහැණියකම බව අනමස්තෙන් වුවත් අප පිළිගත යුතු වෙනවා. කාන්සියි මකා ගනු වස් අපට ගන්න ටෙලිෆෝනය හරහා ලැබෙන ඕපාදූප ආරංචි තවු ලබා පියාඹමිව. අත්තටම අතිසයක මිනිස්සුන්ගෙ පවුල් ජීවිත වලට අනවශ්‍ය විදියට බලපෑම් කරන මේ අය හිතන්නෝන, ඒ තත්ත්වය තමන්ට ඇති වුණොත් අත්වෙන ඉරණම කොයි වගේ වේවද කියලා.

සමගිය අඟය කරන අය වගේම; පුළුවන් නම් ඒ සමගිය නැති කරන්න කටයුතු කරන පිරිසකුත් ඉන්නවා. සමහර විට තව කෙනෙකුගේ උවමනාවට, නැත්නම් ඊර්ෂ්‍යාවක් මුල් කරගෙන එහෙම වෙන්න පුළුවනි.

මං හිතනවා ඔය මොන ගින්නට වුණත් වැඩි ආයුෂ නැහැ. අවුළුවන ගිනි තුමිරංගයක් වෙලා තමන්ටම පත්තු වෙන දවසට; ඒ ගිනි නිවන්න කවුරත් පිහිටට එන්නේ නෑ.

කෙතරම් විශ්වාසවන්ත විදියට ලැබෙන ආරංචියක වුණත් අත්තත හෙළි කරගන්නට වටේ පිටේ මිනිසුන් එකතු කරගෙන කරන සෝදිසි මෙහෙයුම් වලට වඩා; ජීවිතේම දුක-සැප බෙදාගන්න ගේ ඇතුළෙදිම සාකච්ඡා කරලා නිතට ඇතුළු වුණ ගිනි නිවා ගන්නවා නම්... පිටතින් ඉඳන් ගිනි දෙන්නට යන්න දරන පුද්ගලයන් වෙත රැකියාවන් සොයා ගනිව්.

ඔබේ ඉක්මන් තීරණයේ අවමානය ඇසෙන්සන්ඩර් ගෙහැම්බෙල්ට නොව හෙට දින ලෝකයට පය තියන ඔබේම දුවා දරුවන්ටයි.

මේනකා ජයතිලක
ක්වීන්ස්ලන්තය